04. ඔබ විසින් සංවිධානය කරනු ලබන බාහිර පුහුණු වැඩ සටහන්, වක්වැල්ල කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනයේ පුහුණු වැඩ සටහනක් ලෙස සංවිධානය විය යුතු බව ද මෙයින් දන්වන අතර, මීට අමතරව බාහිර පුහුණු වැඩ සටහන් ඉල්ලුම් කිරීමේදී පහත අවශ්‍යතා සම්පූර්ණ කිරීමට කටයුතු කළයුතු බව ද මෙයින් දන්වමි.

(I) පුහුණු වැඩ සටහන සඳහා අවම වශයෙන් පුහුණු ලාභීන් 40 දෙනෙකු සහභාගි කරවීම.

(II) පුහුණු වැඩ සටහන පවත්වන දිනට සති දෙකකට පෙර කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ වෙත ඉල්ලීම් ඉදිරිපත් කර, පුහුණු ආයතනය මගින් පුහුණු වැඩ සටහන් සංවිධානය කර ගැනීම.

(III) පුහුණු වැඩ සටහන් වල සම්පත්දායක දීමනා පුහුණු ආයතනය මගින් ගෙවනු ලබන අතර, ආහාර පාන සැපයීම දිනකට එක පුහුණු ලාභියෙකුට රු. 250/- ක උපරිමයකට යටත්ව ඔබ විසින් සංවිධානය කර ගැනීම.

(IV) පුහුණු වැඩ සටහන අවසන් වී පුහුණු වියදම් සඳහා බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම සඳහා බිල්පත් කඩිනමින් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය වෙත යොමු කිරීම.

05. මෙසේ සංවිධානය කරනු ලබන පුහුණු වැඩමුළු සම්බන්ධීකරණය, අධීක්ෂණය හා සමායෝජනය දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය විසින් සිදු කරනු ලබන අතර, පුහුණු වැඩ සටහනේ පුහුණු ලාභීන්ගේ ආහාර පාන සඳහා වන වියදම් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයේ අනුමත සීමාවන් වලට යටත්ව, රජයේ මූල්‍ය රෙගුලාසි හා නීති රීතිවලට අනුව, ඔබ විසින් දැරිය යුතු අතර, බිල්පත් ඉදිරිපත් කිරීමෙන් පසුව එම මුදල් පුහුණු ආයතනය විසින් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කරනු ඇත.

06. ඒ අනුව ඉදිරියේදී ඔබ ආයතන වල බාහිර පුහුණු වැඩමුළු සංවිධානය කිරීමේදී මෙම උපදෙස් පරිදි කටයුතු කරන ලෙස කාරුණික ව දන්වමි.

07. දකුණ සෞභාග්‍යමත් පළාත බවට පත් කිරීමට ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ආර්.සී.ද සොයිසා
ප්‍රධාන ලේකම් O/C
දකුණු පළාත